පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ 2024/09

මගේ අංකය - එන්සීපී/සීඑස්/පීටී/එෆ්ආර්/05/07
පළාත් භාණ්ඩාගාරය,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2024.10. 28

සියලුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානින්,
ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන ප්‍රධානින් වෙත.

**වාහන අළුත්වැඩියාවන් සිදු කිරීමේදී අනුගමනය කල යුතු ක්‍රමවේදය**

උක්ත හිසින් යුතුව 2021.07.30 දිනැතිව නිකුත් කරන ලද අංක 2021/07 දරණ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය හා එම චක්‍රලේඛයට සංශෝධන ඇතුළත් කරමින් 2021.12.02 දිනැතිව නිකුත් කර ඇති අංක 2021/07 (i) දරණ පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය 2024.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරනු ලැබේ.

02. ඒ අනුව, උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ යන්ත්‍රෝපකරණ ඒජන්සිය වෙතින් වාහන අළුත්වැඩියා කිරීමේදී මේ වන විට උද්ගත වී ඇති බරපතල ගැටළු සැලකිල්ලට ගනිමින් තනි මූලාශ්‍ර මිල කැඳවීම මගින් වාහන අළුත්වැඩියාකිරිමට එම ආයතනය වෙත ලබා දී තිබූ අනුග්‍රහය ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පළාත් සභාවේ ලියාපදිංචි ගරාජ වෙතින් හා එම ගරාජ සමඟ තරඟකාරීව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය වෙතින් වාහන අළුත්වැඩියාවන් සඳහා මිල ගණන් කැඳවා පළාත් මූල්‍ය රීති, වාහන අලුත්වැඩියා සම්බන්ධ පාලන චක්‍රලේඛ හා පළාත් මූල්‍ය රීති සංශෝධනය කරමින් වරින් වර නිකුත් කර ඇති ප්‍රසම්පාදන විධිවිධාන ඇතුළත් චක්‍රලේඛ වල ඇතුළත් උපදෙස් අනුගමනය කර පළාත් සභාවේ වාහන අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ.

ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර,
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත

පිටපත්.

01. විගණකාධිපති - දැ.පි.
02. ප්‍රධාන අභ්‍යන්තර විගණක, උතුරු මැද පළාත - දැ.පි.